ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා

සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
(i)	දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා 2011 වර්ෂයේ ණය සහන පදනම මත ලබා දී තිබූ යතුරුපැදි සඳහා අදාල ණය මුදල වාරික වශයෙන් අයකර ගැනීමෙන් පසුව නිලධාරීන්ගේ නමට පවරන ලද වටිනාකම රු. 1,370,000ක් වූ යතුරුපැදි 29ක් CIGAS ඉන්වෙන්ට්‍රියෙන් ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් දේපළ පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා 2011 වර්ෂයේ ණය සහන පදනම මත ලබා දී තිබූ යතුරුපැදි 29ක් සඳහා වන ණය මුදල වාරික වශයෙන් නිලධාරීන්ගෙන් අයකර ගැනීමෙන් අනතුරුව අදාළ යතුරුපැදි ඔවුන්ගේ නමට පවරා දී තිබුණද අදාල යතුරුපැදි ප්‍රමාණය CIGAS ඉන්වෙන්ට්‍රියෙන් ඉවත් කර නැති බව නිරීක්ෂණය වේ. මේ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර බලා CIGAS වත්කම් ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.	මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් දේපළ, පිරියත හා උපකරණ වටිනාකම නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතු වේ.
(ii)	2020 අගෝස්තු මස 20 සහ 25 දිනවලදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් දෙපාර්තමේන්තුව වෙත පවරාදී තිබූ වටිනාකම රු. 12,000,000 ක් වූ වෑන් රථ දෙකක් CIGAS ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් දේපළ පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	මෙම වාහන දෙක CIGAS වත්කම් ලේඛනයට ඇතුලත් වී නැති බැවින් ඉදිරියේදී CIGAS වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරමින් පවතී.	-එම-
(iii)	සමාලෝචිත වර්ෂය අවසානයේදී පාරිභෝජන ද්‍රව්‍ය ලෙස හඳුනාගත යුතු එකතු වටිනාකම රු. 34,161,849 ක් වූ වර්ග කීපයකට අයත් අයිතම් ස්ථාවර වත්කම් ලේඛණයේ සටහන් කිරීම නිසා දේපළ, පිරියත හා උපකරණ වටිනාකම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	පාරිභෝගික භාණ්ඩ ලෙස හඳුනාගනු ලැබූ අයිතම 251ක ප්‍රමාණයකට අයත් රු.12,114,923ක් වටිනා අයිතම 10,000ක ප්‍රමාණයක් 2024.12.31 දිනට මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන ලදී. තවදුරටත් CIGAS ඉන්වෙන්ට්‍රියේ ඇතුලත්ව පවතින පාරිභෝගික භාණ්ඩ පිළිබඳව පරීක්ෂා කරමින් පවතින අතර, එම භාණ්ඩ ඉදිරියේදී මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	-එම-

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූලධන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 113,013,179 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී කිසිදු උපයෝජනයක් සිදු නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.	මෙම ප්‍රතිපාදන පහත සඳහන් කාර්යයන් සඳහා වෙන් කර ගන්නා ලදී. වර්ණ විභේදන යන්ත්‍රයක් සහ මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු. 95,000,000ක්, මෘදුකාංග සංවර්ධනය සඳහා රු.3,000,000ක්, Conference Kit එකක් මිලදී ගැනීමේ කටයුතු සඳහා රු. 15,013,179ක් ලෙස එකතුව රු. 113,013,179 වේ. මුද්‍රණ යන්ත්‍රයක් හා වර්ණ විභේදන යන්ත්‍රයක් මිලදී ගැනීමේ කටයුතු ජන හා නිවාස සංගණන රාජකාරී සහ මැතිවරණ රාජකාරී නිසා මෙම වර්ෂය තුල අවසන් කරගත නොහැකි විය. Conference Kit එකක් මිලදී ගැනීමට අදාළ අනුමැතීන් ලබා ගැනීමෙන් පසු ප්‍රසම්පාදන කාර්යය සඳහා කාලය ප්‍රමාණවත් නොවීම නිසා අදාල කාර්යය අවසන් කර ගත නොහැකි විය.	වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව හා තාර්කිකව පිළියෙල කළ යුතු වීම.
(ආ)	මූලධන වැය විෂයයන් 8 ක එකතුව රු. 1,322,153,674 ක් වූ ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 387,450,414 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය එක් එක් වැය විෂයය වෙනුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 41 අතර පරාසයක පවතින බව නිරීක්ෂණය විය.	අලුත්වැඩියාවන්ට අදාල ඇස්තමේන්තු ලබාදීමේ ප්‍රමාදය, දෙපාර්තමේන්තුව සතු වාහන සඳහා විශාල අලුත්වැඩියාවන් ඇති නොවීම සහ ජන හා නිවාස සංගණනයේ කාර්ය මණ්ඩල පුහුණු වියදම් එම වැය විෂයය යටතේ දැරීම හා සමහර කාර්යය මණ්ඩල පුහුණු පාඨමාලා සීමා කිරීමට සිදුවීම, සමීක්ෂණ රාජකාරී සඳහා නිලධාරීන්ට දීමනා ගෙවීමේ දී ගෙවීම් චක්‍රලේඛවල කොන්දේසිවලට යටත්ව ගෙවීම් කිරීම, ජන හා නිවාස සංගණනයේ කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් කෘෂිකාර්මික සමීක්ෂණ කටයුතු සිදුනොකිරීම, පානීය ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ ගෘහ සමීක්ෂණයට අදාල වාර්තා මුද්‍රණය කිරීමේ කටයුතු සිදු නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	-එම-

(ඇ)	පුනරාවර්තන වැය විෂයයන් 08 ක එකතුව රු. 74,170,500 ක් වූ ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 11,132,146 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එය එක් එක් වැය විෂයය වෙනුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 32 අතර පරාසයක පවතින බව නිරීක්ෂණය විය.	ජන හා නිවාස සංගණනය -2021 ක්ෂේත්‍ර කටයුතු සිදුකිරීම හේතුවෙන් අනෙකුත් සංගණනයන්හි ක්ෂේත්‍ර කටයුතු සීමාකිරීම, මුද්‍රණ අංශයේ නිලධාරීන් සඳහා නිල ඇඳුම් දීමනාව සඳහා අනුමැතිය නොලැබීම, සුළු අලුත්වැඩියාවන් ඇති නොවීම සහ ප්‍රවාහන දීමනාව හිමි විධායක නිලධාරීන් විශ්‍රාම ලැබීම හා දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලිවල වර්තමාන අගය සංශෝධනය නොවීම හේතුවෙන් අපේක්ෂිත පරිදි බදු මුදල් සංශෝධනය නොවීම යන කරුණු මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	-එම-
(ඈ)	වැය විෂයය අංක 25-2507(13) පානීය ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ ගෘහ සමීක්ෂණය (යුනිසෙෆ්) සඳහා රු. 1,065,244ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර, එයින් රු. 391,244 ක් හෙවත් සියයට 37 ක් ඉතිරි වී තිබුණි.	මෙම ප්‍රතිපාදන යොදා ගෙන මෙම සමීක්ෂණයට අදාල වාර්තා භාෂා තුනෙන්ම මුද්‍රණය කිරීමට අපේක්ෂා කලද, ඒ සඳහා ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වාර්තා මුද්‍රණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මගින් ලබා ගෙන එම කාර්යය අවසන් කිරීමට අපේක්ෂා කරමි.	-එම-
(ඉ)	වැය විෂයය අංක 25-2507(15) ආසියා පැසිපික් කලාපයේ ජාත්‍යන්තර සංසන්දනාත්මක වැඩසටහන (ආ.ස.බැ.) සඳහා රු.8,388,430ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර එයින් රු. 904,900 ක් හෙවත් සියයට 11 ක් ඉතිරි වී තිබුණි.	මෙම සමීක්ෂණ රාජකාරිවල නිරත වූ නිලධාරීන්ට දීමනා ගෙවීම සඳහා වෙන් කරගත් මෙම මුදල, සෙසු සමීක්ෂණ රාජකාරිවල නිරත වූ නිලධාරීන්ට දීමනා ගෙවීමේදී අදාළ කර ගන්නා ලද පොදු ගෙවීම් ක්‍රමවේදය පිළිබඳ චක්‍රලේඛවල කොන්දේසිවලට යටත්ව ගෙවීම් සිදු කිරීමට සිදුවීමෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි විය.	-එම-

3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු වසරකට වැඩි ණය ශේෂය රු. 192,880 ක් විය.	විශ්‍රාම ගිය ක්ෂේත්‍ර ලිපිකරු නිලධාරියාගෙන් අයවියයුතු රු. 192,880 ක් වූ මුදල සඳහා ප්‍රදාන පත්‍රය මේ වන තෙක් ලැබී නොමැති බැවින් මෙම මුදල අය කර ගැනීමට නොහැකි විය.	ණය ශේෂ නිරවුල් කරගැනීමට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කිරීම.
(ආ)	සේවය අත හැර ගිය නිලධාරීන් තිදෙනකුගෙන් වසර 05 සිට 12ක් දක්වා කාලයක් අය නොවී පවතින ණය ශේෂ එකතුව රු. 259,174 ක් වූ අතර සේවය අත හැර ගිය මාස 18 ට වැඩි තවත් එක් නිලධාරියකුගෙන් අය විය යුතු ණය ශේෂය රු. 107,200 ක් විය. එම ණය ශේෂ අයකරගැනීමට 2025 මැයි 30 දින තෙක් කටයුතුකර නොතිබුණි.	සංඛ්‍යාලේඛන නිලධාරී මහතකුගෙන් අයවිය යුතු රු. 95,140 ක ණය මුදල අයකර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇත. කා. සේ. සේවයේ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 59,140 ක මුදල සඳහා උපදෙස් ලබා ගැනීමට නීතිපති වෙත යොමු කර ඇත. තවත් කා.සේ. සේවයේ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 104,250 ක මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි කටයුතු කරමින් පවතී. සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 107,200 ක ණය ශේෂය අය කර ගැනීම සඳහා ඇය පිළිබඳ තොරතුරු හංවැල්ල පොලිස් ස්ථානාධිපති වෙතින් විමසා ඇති අතර මෙතෙක් ඒ සඳහා පිළිතුරු ලැබී නොමැත.	-එම-

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබාදීම මඟින් වඩාත් ඵලදායි ලෙස දේශයේ සමාජ ආර්ථික සංවර්ධනයට දායකවීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් දත්ත වෙබ් අඩවියට උඩුගතකිරීම හා මුද්‍රණය කර මුදාහැරීම සිදු කරනු ලබන අතර ඒ සඳහා සංගණන හා සමීක්ෂණ ගණනාවක් තුලින්	පිළිතුරු ලබා දී නොතිබුණි.	තීරණ ගැනීම පහසු කිරීම සඳහා නියමිත දින වකවානු තුළ දත්ත වාර්තා නිකුත් කිරීමට කටයුතු කළ යුතු වීම.

	දත්ත රැස්කරනු ලබයි. එසේ වුවද, මුද්‍රණය කිරීමට නියමිතව තිබූ දත්ත වාර්තා 23 ක් නියමිත දිනට මුද්‍රණය කර නොතිබූ අතර උඩුගතකිරීමට නියමිතව තිබූ දත්ත වාර්තා 39 ක් 2025 අප්‍රේල් 02 දින දක්වාත් වෙබ් අඩවියට නිකුත් කර නොතිබුණි. එසේම දත්ත වාර්තා 19 ක් නියමිත දිනයට වඩා දින 07 ත් මාස 6 ත් අතර කාල පරාසයක ප්‍රමාදයකින් පසුව වෙබ් අඩවියට උඩුගතකර තිබුණි.		

4.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණයට (DHS) අදාල පරිගණක ආශ්‍රිත පෞද්ගලික තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ (CAPI System) කාර්යය, අදාල අංශය සහ තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ අංශය විසින් 100% ක ප්‍රගතියකින් ඉටු කළ යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාල කටයුතු ආරම්භ කර නොතිබුණි. වසර 5කට වරක් සිදු කරනු ලබන මෙම සමීක්ෂණය අවසන් වරට 2016 වර්ෂයේදී සිදු කර තිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	සංගණන සහ සමීක්ෂණ නියමිත පරිදි සිදුකර කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබාදීමට කටයුතු මෙහෙයවිය යුතු වීම.
(ආ)	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, සයිබර් ආරක්ෂණ සමීක්ෂණයේ මෘදුකාංග සංවර්ධනයට අදාල (Cyber Security Survey Software Development) කාර්යයන් තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ අංශය සහ නියැදි සමීක්ෂණ අංශය මගින් 100% ක ප්‍රගතියකින් ඉටු කළ යුතු	-එම-	-එම-

වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු ආරම්භ කර නොතිබුණි.

4.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාර්ෂික කාර්යසාධන වාර්තාවට අනුව දෙපාර්තමේන්තුවේ අංශ 05 කට අදාල කාර්යයන් 05 ක භෞතික ප්‍රගතික ප්‍රගතිය 15% - 40% අතර පරාසයක පැවැතුණි.	• **ජාතික ගිණුම් අංශය -** ජන හා නිවාස සංගණනය-2024 ට අදාලව රාජකාරි බහුල වීම නිසා ලොජිස්ටික් සමාගම්වලින් දත්ත රැස්කිරීමට අදාල පරිගණක වැඩසටහන සකස් කිරීමේ කටයුතු ප්‍රමාද විය. • **ක්ෂේත්‍ර කළමනාකරණ අංශය -** ප්‍රධාන විදුලි පද්ධතියේ ඇති වූ දෝෂයක් හේතුවෙන් දීර්ඝ කාලයකට දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ අන්තර්ජාල බිඳවැටීමක් සිදු වීම හේතුවෙන් මාර්ගගත ක්‍රමය ඔස්සේ මෙම වැඩමුළුව පැවැත්වීමට නොහැකි විය. ඉන්පසු ජන හා නිවාස සංගණනයේ රාජකාරී සඳහා නිලධාරීන් සහභාගී වීම නිසා වාර්ෂික පුහුණු වැඩමුළුව පැවැත්වීමට නොහැකි විය. • **පුහුණු කිරීමේ අංශය -** **දෙපාර්තමේන්තුවේ සහායක කාර්ය මණ්ඩලය සඳහා දෙපාර්තමේන්තුව තුළ හා පිටත කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම -** ජන හා නිවාස සංගණනයේ කටයුතු සඳහා නිලධාරීන් යොදාගැනීම නිසා සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. • **පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශය -** **Annual magazine of official statistics related articles by Department of Censes and Statistics of officials -** ජන හා නිවාස සංගණනයේ රාජකාරී සඳහා කාර්ය මණ්ඩලය යෙදවීම හේතු වූ අතර දෙපාර්තමේන්තුව ඉදිරියේදී පැවැත්වීමට නියමිත සංගණන අවසන් වන තුරුම මෙම ප්‍රකාශනය කරගෙන යාම තාවකාලිකව අත්හිටුවීමට තීරණය කර ඇත.	සැලසුම් කළ පරිදි අපේක්ෂිත නිමැවුම් මට්ටම් ළඟා කරගැනීමට කටයුතු කළ යුතු වේ.

4.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපාන සර්වර් පරිගණක කාමරයෙහි ස්ථාපිත කර ඇති අඛණ්ඩ උෂ්ණත්වය නියාමනය සඳහා අත්‍යවශ්‍ය (precision air cooling system) සිසිලන පද්ධති දෙකෙන් Teenair වර්ගයේ යන්ත්‍රය වසර 02ක සිට අක්‍රියව පවතින අතර Liebert වර්ගයේ යන්ත්‍රයේ මාස 09ක පමණ සිට කාර්මික දෝෂයක් පවතින බවත් තාවකාලික සිසිලන අවශ්‍යතාවය සඳහා පවතින Frostair වර්ගයේ සාමාන්‍ය සිසිලන පද්ධතියද අක්‍රියව පවතින බවත් නිරීක්ෂණය කෙරේ. තවද, ඒ සඳහා විදුලි සම්බන්ධතා ලබා ගන්නා UPS යන්ත්‍රයේ වගකීම් කාලය ඉක්මවා ඇති බවත් නිරීක්ෂණය විය. ඒ අනුව, සර්වර් පරිගණක තුළ ඇති ජාතික වශයෙන් ඉතා වැදගත් දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 2025 මැයි 30 දින දක්වා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවට නිරීක්ෂණය විය.	Technair වායු සමීකරණ යන්ත්‍රයේ අළුත්වැඩියාව සඳහා ආයතනයක් විසින් ඉදිරිපත් කර ඇති රු. 1,236,500ක් වූ ඇස්තමේන්තුවට අනුව අළුත්වැඩියාව සිදු කිරීම ඵලදායිද යන්න තීරණය කිරීම සඳහා පත්කරන ලද කමිටුව විසින් 2025 ජූනි 11 දින ලබාදුන් කමිටු නිර්දේශයට අනුව රජයේ අනුමත ආයතනයක් වෙතින් තාක්ෂණික සත්‍යතා වාර්තාවක් ලබාගෙන එහි නිර්දේශ අනුව කටයුතු කළ යුතු වේ. සර්වර් පරිගණක කාමරයෙහි ස්ථාපිත වායු සමීකරණ යන්ත්‍ර ඉතාමත් පැරණි ඒවා වීමත්, නිරන්තරයෙන් ඒවා ක්‍රියාවිරහිත වීමත්, හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යය සාධනය කෙරෙහි මෙන්ම දත්තවල ආරක්ෂාව කෙරෙහි ද සිදුවන බලපෑම් පිළිබඳව සළකා බලා 2025 වාර්ෂික ඇස්තමේන්තුවලට වායු සමීකරණ යන්ත්‍ර 02ක් මිල දී ගැනීම සඳහා ප්‍රතිපාදන ඇතුලත් කරන ලදී. 2025 අප්රේල් මස අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කර දී ඇත. ඒ අනුව Frostair වර්ගයේ වායු සමීකරණ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් ක්‍රියාවලිය සිදු කරමින් පවතී. UPS යන්ත්‍රය සඳහා 2025.06.01 සිට 2026.05.31 දින දක්වා වසරක කාලයකට රු. 206,500 ක මුදලකට සේවා ගිවිසුම් ගත වීම සඳහා ලංසු ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇත. 2025 සැප්තැම්බර් 12 දින තෙක් ගිවිසුමකට එළඹ නොමැත.	දත්තවල ආරක්ෂාව තහවුරු කිරීමට ගත හැකි සියළු පියවර ගැනීම අවශ්‍ය වේ.
(ආ)	දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදනයට පෙර නිසි අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව 2014 දෙසැම්බර් 29 දින රු. 16,320,304 ක් ගෙවා UPS යන්ත්‍ර 18ක් මිලදී ගෙන තිබුණු අතර, මේ සඳහා කාර්යසාධන සුරක්ෂණයක්	මොරටුව විශ්ව විද්‍යාලය වෙත රැගෙන යන ලද UPS යන්ත්‍ර 3 පරීක්ෂා කර බලා ඔවුන් විසින් තත්ත්ව වාර්තාවක් ලබා දී ඇති අතර, මෙම UPS යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට අධික පිරිවැයක් දැරීමට සිදුවන බවත්, නැවත ක්‍රියාකාරී තත්ත්වයෙන් කොපමණ කාලයක් පවතීද යන්න නිශ්චිතව පැවසිය	ජාතික වශයෙන් ඉතාමත් වැදගත් හා වටිනා දත්ත විශාල ප්‍රමාණයක් මෙහෙයවනු ලබන පරිගණක ඇතුලු වටිනා යන්ත්‍ර හා ඒවායේ ඇතුළත්

	ලබාගෙන නොතිබුණි. 2022 සැප්තැම්බර් 15 දින සැපයුම්කරු විසින් දන්වා ඇති පරිදි UPS යන්ත්‍ර 11 ක අභ්‍යන්තර උපාංග අක්‍රීය වී ඇත. කෙසේ වුව ද 2024 දෙසැම්බර් 11 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී යන්ත්‍ර සියල්ලම අක්‍රීය වී ඇති බව නිරීක්ෂණය විය. මෙම යන්ත්‍රවල සේවා කටයුතු සඳහා මිලදීගත් වටිනාකමද ඉක්මවා ගිවිසුම් 05ක් යටතේ රු.17,034,150ක් ගෙවා තිබුණි.ඒ අනුව, ජාතික වශයෙන් ඉතාමත් වැදගත් හා වටිනා දත්ත විශාල ප්‍රමාණයක් මෙහෙයවනු ලබන පරිගණක යන්ත්‍ර UPS යන්ත්‍ර නොමැතිව අනාරක්ෂිතව ක්‍රියාත්මක වන බවට නිරීක්ෂණය විය.	නොහැකි බවත් දැනුම් දී ඇති බැවින් මෙම යන්ත්‍ර පිළිබඳව තීරණයක් ගැනීමට කමිටුවක් පත් කිරීම සඳහා විදුලි ඉංජිනේරුවරයකු නම් කර එවන ලෙස ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. ඒ අනුව, කමිටු වාර්තා ලද පසු මෙම යන්ත්‍ර පිළිබද ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරමි.	දත්ත ආරක්ෂා කරගැනීමට කළමනාකාරිත්වය විසින් කටයුතු කළ යුතු වීම.
(ඇ)	2023 දෙසැම්බර් 29 රු. 2,980,000 කට මිලදී ගෙන තිබූ ලැප්ටොප් පරිගණක 10 ක සාම්පල, අදාල පිරිවිතරවලට අනුකූලතාවය පරීක්ෂාකර තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර නොතිබුණු අතර, සියළු පරිගණක දෙපාර්තමේන්තුවට ලැබීමෙන් පසු ඒවා දෙපාර්තමේන්තු පිරිවිතරයට අනුකූල නොවන බවට තොරතුරු තාක්ෂණ අංශය විසින් 2024 ජනවාරි 08 දින නිර්දේශකර තිබුණි. එසේ වුවද, අදාල නිර්දේශ නොසලකා 2024 පෙබරවාරි 16 සහ සැප්තැම්බර් 03 දිනවලදී සම්පූර්ණ වටිනාකම ගෙවීමට කටයුතු කර තිබුණි. තවද, මෙම මිලදීගැනීම 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.	පානීය ජලයේ ගුණාත්මක තත්වය පිළිබඳව ගෘහ ඒකක සමීක්ෂණ සඳහා UNICEF ආයතනය විසින් ලබාදී ඇති මුදලින් දෙපාර්තමේන්තුවට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම සඳහා වන එකඟතාවය එම ආයතනය විසින් ලබා දී ඇති බැවින් එම මුදලින් සහ ඉතිරිය සඳහා දේශීය අරමුදලින් ගෙවීමටත් දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා දී තිබුණි. ඒ අනුව ලැප්ටොප් 8ක් සඳහා රු.2,514,000 ක් UNICEF අරමුදලින් ද ලැප්ටොප් 02ක් සඳහා රු. 628,500 ක් දේශීය අරමුදලින් ද ගෙවන ලදි. UNICEF අරමුදල් 2023.12.31 වන විට ගෙවා අවසන් කල යුතු බැවින් එදිනට පෙර චෙක්පත් ලිවීමට කටයුතු කරන ලදි. 2023 ප්‍රසම්පාදන සැලැස්ම 2023.01.09 දිනදී සකස් කළ බැවින් මෙය එම සැලැස්මට ඇතුලත් කර නොමැත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව මිලදීගැනීම් සිදුකළ යුතු වීම.

(ඇ)	2017.06.28 දිනැති අංක 01/2017 දරන භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත්කරන ලද වත්කම් හා පිරිවැය කළමනාකරණ චක්‍රලේඛයේ 07 හා 08 ඡේද ප්‍රකාරව, 2018 වසරේ සිට ආයතනයක් විසින් මිලදී ගන්නා ලද සහ අපහරණය කරන ලද වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාල කාර්තුව අවසානයේ දී කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී අදාල චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.	චක්‍රලේඛ උපදෙස් පරිදි වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාළ බලධාරීන් වෙත නියමිත කාලවකවානු තුල ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දෙන ලදී.	චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතු වීම.
(ඉ)	2018.12.31 දිනැති අංක 04/2018 දරන භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත්කරන ලද මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ ඇමුණුම 1 හි 3.3 ඡේදය ප්‍රකාරව, සෑම වර්ෂ 5 කට වරක්ම කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ සඳහා තක්සේරු වාර්තාවක් ලබාගත යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.	අදාල චක්‍රලේඛ උපදෙස් පරිදි වාහන/යන්ත්‍රෝපකරණ/කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ යනාදී වත්කම් නැවත තක්සේරු කිරීම සඳහා කටයුතු කරමින් පවතී.	-එම-
(ඊ)	ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ පවතින ප්‍රමාණාත්මක හා ඉක්මන් අවධානය යොමුවියයුතු අඩුපාඩු පිළිබඳව පසුගිය වර්ෂයේ විගණන වාර්තාව මඟින් කරුණු ඉදිරිපත් කළ ද 2025 මැයි 30 දින තෙක් අදාල අඩුපාඩු නිවැරදි කර නොතිබුණි.	ගොඩනැගිල්ලේ ජලරෝධනය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ඇස්තමේන්තු කැඳවා ඇත. පළමු අදියර ලෙස විදුලි සෝපාන යන්ත්‍ර කාමරය සහ 10 වන මහලේ කෑම කාමරයෙහි ඉහළ slab කොටස ජලරෝධනය සඳහා රු. 33,718,000 ඇස්තමේන්තුවක් සහ 05 වන මහලේ පිහිටි මිල හා වේතන අංශයේ Concrete Slab හි ජල කාන්දුව පිළිසකර කිරීමට රු. 6,598,000 ක් වූ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා අනුමැතිය ලැබී තිබුණි. ප්‍රතිපාදන පිළිවෙලින් 2025.05.16 දින සහ 2025.03.13 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.	ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ පවතින ප්‍රමාණාත්මක වූ අඩුපාඩු කඩිනමින් නිවැරදි කිරීම කළ යුතු වේ.

		ලබා දී ඇති කාල රාමුවට අනුව 2025 දෙසැම්බර් 29 දින වන විට කටයුතු අවසන් කළ යුතු වේ.	
(ට)	පසුගිය වර්ෂයේදීද මාගේ වාර්තාව මගින් අනාවරණය කරනලද, මුද්‍රණ අංශය තුළ නිශ්ක්‍රීයව පවතින වායුසමීකරණ යන්ත්‍ර 40 ක් පිළිබඳව 2025 මැයි 30 දින තෙක් සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි.	මෙම වායු සමීකරණ යන්ත්‍ර පිළිබඳව තීරණයක් ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර කමිටු වාර්තාවට අනුව කටයුතු කරමින් පවතී.	නිශ්ක්‍රීයව පවතින මෙම වායුසමීකරණ යන්ත්‍ර පිළිබඳව කළමණාකාරිත්වය විසින් සුදුසු පරිදි කටයුතු කළ යුතු වේ.
(ටා)	දෙපාර්තමේන්තුවේ වත්කම් ලේඛනය (CIGAS) අනුව, එක් එක් වත්කම කුමන අංශවල භෞතිකව පවතීද යන්න විගණනයට තහවුරුකරගත නොහැකි විය.	පිළිතුරු ලබා දී නොතිබුණි.	වත්කම් කුමන අංශවල භෞතිකව පවතීද යන්න තහවුරු කර ගත යුතු වීම.

5. **මානව සම්පත් කළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලය වූ 1,764 න් සියයට 29 ක් හෙවත් පුරප්පාඩු 518 ක් පැවතුණි. එසේම, දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි ඍජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුර 146 ඇතුලු අවශ්‍යා පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට හෝ අවශ්‍යාතාවය අනුව අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට 2025 මැයි 30 දින තෙක් විධිමත් පියවර ගෙන නොතිබිණ.	රට තුල ඇතිවූ ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය සේවය සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම් නතර කිරීම නිසා වසර කිහිපයක් දෙපාර්තමේන්තුව වෙත නව බඳවා ගැනීම් සිදු නොකරන ලදී. සංඛ්‍යාලේඛනඥ තනතුරු 22ක පුරප්පාඩු පිරවීම සඳහා සීමිත පදනම මත අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුමැතිය සඳහා 2024-07-23 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. සංඛ්‍යාලේඛන නිලධාරී තනතුරු 71ක් සඳහා සීමිත පදනම යටතේ නිලධාරීන් බඳවා ගැනීමට, සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය අනුමැතිය සඳහා 2024-10-24 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.	අදාල විධිවිධාන පරිදි කටයුතු කර විධිමත් පරිදි පුරප්පාඩු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වේ.